# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 11,668—1959 පෙබරවාරි 18 වැනි බදාදා—18.2.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**ජේ./13/1959 දරණ ආහාර මිල නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය.**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

යාපනය දිස්ත්‍රික්කයේ උප ආහාර මිල පාලක තැන්පත් වෙල්ලයියා නිට්කුණානන්දන් වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1958 සැප්තැම්බර් 15 දින අංක 11,525 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරණ ලද 1958 සැප්තැම්බර් 10 වෙනි දින නො. ජේ./7/1958 දරණ නියෝගයේ පළමුවැනි උපලේඛනයෙහි සඳහන් උම්බලකඩ පිළිබඳව එම උපලේඛනයෙහි 2 වැනි හා 3 වැනි තීරවල සඳහන් තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක්ද සිල්ලර වෙළෙන්දකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල පිළිවෙලින් සඳහන් මිළ ගණන් යාපන ආදායම් පාළක නිලධාරි කොට්ඨාශය (යාපන නගර සභා ප්‍රදේශයද ඇතුළුව) තුළ විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියෝග කරමි.

(3) මෙම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව 1958 සැප්තැම්බර් 15 දින අංක 11,525 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරණලද 1958 සැප්තැම්බර් 10වන දින නො. ජේ./7/1958 දරණ ආහාර මිළ නියෝගයේ 3–9 දක්වා ඡේදයන් මෙම නියෝගයේම අන්තර්ගතවූ හැටියට සැලකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1959 පෙබරවාරි 14 වෙනි දින පෙරවරු 9.50ට යාපනේ කච්චේරියේදී අත්සන් තබන ලදී.

සී. නිට්කුණානන්දන්,
උප ආහාර මිළපාලක තැන, යාපන දිස්ත්‍රික්කය.

උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| විස්තර | හො. 1ක් තොග වශයෙන් තොග වෙළෙන්දකු විසින් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දකු විසින් රා. 1ක් සිල්ලරට විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ (සියළුම වර්ග) ... ... ... | 243 85 ... | 2 43 |

**සැලකිය යුතුයි.**—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මෙවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නො විකිණිය යුතුය.

531—ජේ. ඇන්. ආර් 377—4,000 (2/59)

අංක ජේ/15/1959 දරණ ආහාර මිළ නියෝගය.

එළුමස්

## 1950 අංක 29 දරණ මිළ පාලන පණත

### නියෝගය

උප මිළ (ආහාර) පාළක තැන්පත් වෙල්ලයියා නිට්කුණානන්දන් වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පණතේ 4වන වගන්තියෙන් මා වෙත පැවරි ඇති බලතල අනුව—

(i) මීට යාකර ඇති උපලේඛනයේ 2,3,4 හා 5 වන තීරයන්හි සඳහන් මිළ, එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ගවලට හා ශ්‍රෙනිවලට අයත් එළුමස්, රාත්තලක වැඩිම මිළ වශයෙන්ද, එම උපලේඛනයේම 1 වන තීරයේ සඳහන් ප්‍රදේශය තුළ එකී මිලට වැඩියෙන් නොවිකිණිය යුතු බවද මෙම නියෝගයෙන් නියම කරමි.

(ii) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා —

(අ) එළුමස් යනුවෙන් හැඟවෙන්නේ එළුවකුගේ හෝ බැටළුවකුගේ මාංශයයි. බොකු බඩවැල් ආදි සියළු ආකාර ඉවත් කරනු ලබන දේ මෙයට ඇතුළත් නොවේ.

(ආ) එළුවකුගේ හෝ බැටළුවකුගේ සිරුර විකිණීම සඳහා මස් මඩුවේ පිළියෙලකර තිබෙන කල (එනම්, හිස, හම, බොකු බඩවැල්, කුර ආදි සියළුම ආකාර ඉවත් කරනු ලබන දේ අත්හැර) ''තනි බර'' අනුව විකුණනු බව සලකනු ලැබේ ;

(ඇ) ''පිකුදු'' යනුවෙන් එළුවන්ගේ හා බැටළුවන්ගේ පිකුදු හැඳින්වේ.

(iii) කටු සහිත මස් විකුණන කල්හි කටුවල බර මුළු බරින් සියයට 25කට වඩා වැඩි නොවිය යුතු.

(iv) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියමකර ඇති ප්‍රදේශයේ සියළුම තැන්හි, වාහනයන්හි හා යාත්‍රාවන්හි, උපලේඛනයේ සඳහන් වර්ගවලට, ශ්‍රෙණිවලට අයත් මාංශ ඇති සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ සඳහන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ, වාහනයේ හෝ යාත්‍රාවේ පැහැදිළිව පෙනෙන ලෙස තැබිය යුතු.

(v) ඉවත දමනු ලබන දේද එළුමස් සමග එකම ගනුදෙනුවකදී විකුණනු විට, එළු මස් වෙන් වශයෙන් කිරා විකිණිය යුතු.

(vi) සෑම වෙළෙන්දකුම එළුමස් හෝ පිකුදු විකුණනු කල්හි, මස් ගන්නාට, සැබෑ බර පහසුවෙන් බලාගැනීමට හැකිවනසේ බර කිරන තරාදිය තැබිය යුතු.

(vii) මීට යාකර ඇති උපලේඛනයේ සඳහන් වර්ගවලට හා ශ්‍රෙණිවලට අයත් එළුමස් හෝ පිකුදු විකුණන සෑම වෙළෙන්දකුම, එළුමස් ගන්නා කුයිතාන්සියක් ඉල්ලා සිටිය විට දිය යුතු. එම කුයිතාන්සියේ—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ මස්වල විස්තරය ;

(ඈ) මස්වලට ගෙවූ මුදලද සඳහන් විය යුතු ;

(viii) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනලද ප්‍රදේශයන්හි, මෙම උපලේඛනයේ සඳහන් දේ වෙන කිසියම් මාංශයක් සමග කළවම් කොට නොවිකිණිය යුතු.

(ix) උපලේඛනයේ සඳහන් දේ විකුණනු කල්හි, එකී දේ ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිලක් මෙම උපලේඛනයේ 2,3,4 හා 5 වන තීරයන්හි සඳහන් වැඩිම මිළෙහි අන්තර්ගත වේ.

(x) මෙම නියෝගයෙහි කාර්‍ය සඳහා ''රාත්තල'' යන්නෙන් හැඳින්වෙන්නේ ඇවර්ඩූ පොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තල් බර බවද නියම කරමි.

1959 පෙබරවාරි මස 14 දින පෙරවරු 10ට යාපනය කච්චේරියේදී අත්සන් තබන ලදී.

සී. නිට්කුණානන්දන්,
උප මිළ (ආහාර) පාළක තැන, යාපනය දිසාව.

## උපලේඛනය

### එළුමස් සඳහා වැඩිම මිළ

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>කටු රහිත එළු මස් රාත්තලක් | 3 වැනි තීරය<br>කටු සහිත එළු මස් රාත්තලක් | 4 වැනි තීරය<br>එළු මස් තනි බර අනුව රාත්තලක් | 5 වැනි තීරය<br>පිකුදු රාත්තලක් |
|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| යාපන නගරය (නගර සභා සීමාව තුළ) ... | 2 25 ... | 2 00 ... | 1 70 ... | 3 00 |
| යාපනය දිසාව (යාපනය නගර සභා සීමාව හැර) ... | 2 15 ... | 1 90 ... | 1 60 ... | 2 90 |

**සැලකිය යුතු.**—මේ මිළ ගණන් ඉහත සඳහන් මස් විකිණිය යුතු නියම මිළ නොව, ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. මෙම මිළ ගණන්වලට ඉහළින් මෙම ද්‍රව්‍යය විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරණ ලදී.